# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,933 — 1970 නොවැම්බර් 20 වැනි සිකුරාදා — 1970.11.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පින්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... ... | 154 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 153 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | 154 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — | | |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර, හියු නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සැහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදරට චාරිකාව සඳහා මහනුවරදී 1970 දෙසැම්බර් මස 2 වැනි බදාදා සිට පැවැත්වීමට නියමිත අපරාධ අධිකරණ වාරයට අමතරව, එදිනම කුරුණෑගලදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1970 නොවැම්බර් 7 වැනි දින,
කොළඹදී.

11-500

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
**කොළඹ.**

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

# දිස්ත්‍රික් උසාවිවල හා රට පහළ උසාවිවල දැන්වීම්

## 1971 වර්ෂයට වැඩ සටහන—සංචාරක උසාවිය—පන්විල

1971 වර්ෂයේදී පහත සඳහන් දිනයන්වල ම විසින් පන්විල සංචාරක උසාවි පවත්වනු ලැබේ :—

ජනවාරි : 9, 16, 24, 31
පෙබරවාරි : 14, 22
මාර්තු : 1, 9, 16, 23, 30
අප්‍රේල් : 7, 22, 29
මැයි : 7, 14, 22, 29
ජූනි : 6, 13, 20, 27
ජූලි : 5, 12, 20, 27
අගෝස්තු : 4, 11, 18, 25
සැප්තැම්බර් : 2, 9, 16, 23
ඔක්තෝබර් : 1, 8, 16, 23, 31
නොවැම්බර් : 7, 15, 22, 29
දෙසැම්බර් : 6, 14, 21, 29

එෆ්. ජී. බී. ප්‍රනාන්දු,
මහනුවර මහේස්ත්‍රාත්.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
මහනුවර-මහේස්ත්‍රාත් උසාවියේදීය.

11-533

## වලස්මුල්ලේ සංචාරක උසාවිය

1971 වර්ෂයේ පැවැත්වෙන දින

| 1971 | | | | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 9 | 16 | 17 | 24 | 31 |
| පෙබරවාරි | 14 | 15 | 22 | | |
| මාර්තු | 1 | 9 | 16 | 23 | 30 |
| අප්‍රේල් | 7 | 15 | 22 | 29 | |
| මැයි | 7 | 14 | 22 | 29 | |
| ජූනි | 6 | 13 | 20 | 27 | 28 |
| ජූලි | 5 | 12 | 20 | 27 | |
| අගෝස්තු | 4 | 11 | 18 | 25 | 26 |
| සැප්තැම්බර් | 2 | 9 | 16 | 23 | |
| ඔක්තෝබර් | 1 | 8 | 16 | 23 | 31 |
| නොවැම්බර් | 7 | 15 | 22 | 29 | |
| දෙසැම්බර් | 6 | 14 | 21 | 29 | |

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා,
දිස්ත්‍රික් නඩුකාර තැන, තංගල්ල.

මහේස්ත්‍රාත් උසාවිය,
තංගල්ල.

11—553

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## බදුල්ල දිස්ත්‍රික් උසාවියේදීය

මුත්තයියා සහ පුත්‍රයෝ සහ සමාගම, 75-87, මහවීදිය, බණ්ඩාරවෙල ................................ පැමිණිලිකාරයා.

නොම්මරය : එම්/6902. එදිරිව

1. ටී. රාමනාදන් හා වී. රාමනාදන්, ජවර්හලන්ඩ් වත්තු, මිරහවත්ත ................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපළවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ සම්පත්ජනයන් වර්ෂ 1970ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින පෙවරු 11 ට ඉඩම් පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රු. 28,5[illegible]0 ක් සහ ගාස්තුව රු. 423ක් හා පවුන්ඩේජ් මුදලත් අයකර ගැනීමට සඳහාය.

1. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ දෙහිවිනි පළාත කෝරළේ කුරුකුදේ ගම පිහිටි උතුරට : ගල්කඩකඳුරට වෙන් කරන ලද ඉඩම වඩාත් නිවැරදිව ගල්කඩකඳුර දිගට පිසවේසම, නැගෙනහිරට : පාරට වෙන්කරන ලද ඉඩම වඩාත් නිවැරදිව පාර දිගට පිසවේසම, දකුණට : කට්ටි අංක 38 හා බටහිරට : මානැවිල්ල ඔයට වෙන්කරන ලද ඉඩම් වඩාත් නිවැරදිව මානැවිල්ල ඔය දිගට පිසවේසම වශයෙන් මායිම් වූ අඹදන්ඩේතැන්න නමැති අක්කර 10, රූ. 1, පර්චස් 33 ක් වපසරිය ඇති ඉඩම හා එහි තුළ පිහිටි සෑම සියළු දේත්ද වේ. මෙය 1922 කේ අප්‍රේල් මස 26 වැනි දින අංක 348727 වශයෙන් පිඹුර ගතකොට ඇති ඩබ්ලිව්. සී. ඇස්. එන්ගල්ස් සර්වේ ජනරාල් තුමා විසින් සහතික කර බදුල්ල ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ අංක සී. 344/50 වශයෙන් ලියාපදිංචි කර ඇත.

2. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මැදිකිඳ කොට්ඨාශයේ මහපළාත කෝරළේ කොන්තෙහෙල ගම පිහිටි උතුරට : පී. පී. 76 කට්ටි අංක 1 හා 5 ද, නැගෙනහිරට : කට්ටි අංක 5 සී. හා 5 එප් ද, දකුණට : පී. පී. 76 කට්ටි අංක 5 එප් සහ බටහිරට : පී. පී. 76 කට්ටි අංක 5 එප් හා 5 වඩාත් නිවැරදිව පී. පී. 76 කට්ටි අංක 5 එප් හා 5 ද වශයෙන් මායිම් වූ කහටදන්ඩ නොහොත් දළුකැලේ පතන නමැති අක්කර 40 යි, රූඩ් 1 යි, පර්චස් 18 ප්‍රමාණය ඇති ඉඩම හා එහි තුළ ඇති සෑම සියළු දේත්ද වේ. මේ ඉඩම මැදින් ඇති පාර මීට අඩංගු නොවේ. මෙය වර්ෂ 1912 හේ මාර්තු 7 වැනි දින අංක 280808 වශයෙන් පිඹුර ගතකොට ආර්. ඇස්. තැම්පල්ටන් සර්වේ ජනරාල් තුමා විසින් සහතික කර බදුල්ල ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ අංක ජේ. 4/236 වශයෙන් ලියාපදිංචි කර ඇත.

3. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ දඹවිනි පළාත කෝරළයේ මිරහවත්තේ ගම පිහිටි 1961 අගෝස්තු මස 12 වැනි දින බලයලත් මිනින්දෝරු එම්. ඒල්. තිර්තවේළු මහතා විසින් පිඹුර අංක 1677 තේ කට්ටි අංක 7 වශයෙන් පෙන්වා දී ඇති උතුරට : කට්ටි අංක 31 වෙන්වන කාණුව හා මානැවිල්ල ඔය, නැගෙනහිරට : එෆ්. වී. පී. 63 නේ අතිරේක කොටසේ අංක 1 කේ කට්ටි අංක 102 ද, දකුණට : පිඹුර අංක 1476 ඒ හි කට්ටි අංක 1 ඒ, 1 බී හා කට්ටි අංක 34 ද, බටහිරට : හීල්පන්කඳුරද වශයෙන් මායිම් වූ බලයලත් මිනින්දෝරු එච්. එම්. මූණසිංහ මහතා විසින් 5.9.58 දින පිඹුර අංක 1677 තේ අක්කර 1, රූඩ් 3, පර්චස් 11.4 ප්‍රමාණය ඇති බවට සටහන් කර ඇති මාස්නාවත්ත නමැති ඉඩම හා එහි තුළ ඇති සෑම සියළු දේත්ද වේ.

4. ඉහත සඳහන් මිරහවත්තේ ගම පිහිටි පිඹුර අංක 1677 තේ කට්ටි අංක 8 වශයෙන් පෙන්නුම් කෙරෙන උතුරට : කට්ටි අංක 102 හා මානැවිල්ල ඔය, නැගෙනහිරට : මානැවිල්ල ඔය, දකුණට : රජයේ පතන හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු පාර, බටහිරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තු පාර හා රජයේ ඉඩම වෙන් වන පැලඉනි වැටද වශයෙන් මායිම් වූ 1968 අප්‍රේල් මස 6 වැනිද සහ සැප්තැම්බර් මස 5 වැනි දින බලයලත් මිනින්දෝරු එච්. ඇම්. මූණසිංහ මහතා විසින් අංක 1677 දරණ පිඹුරේ අක්කර 8, රූඩ් 0, පර්චස් 39.8 බවට සටහන් කර ඇති මාස්නා වත්ත නමැති ඉඩම හා එහි තුළ ඇති සෑම සියළුදේද වේ.

ඉහත සඳහන් කට්ටි අංක 7 හා 8 පහත සඳහන් 3 හා 4 යටතේ බෙදන ලද කොටස් ය :—

(අ) ඉහත සඳහන් මිරහවත්තේ ගම පිහිටි උතුරට : එෆ්. වී. පී. 63නේ කට්ටි අංක 31 හා මානැවිල්ලේ ඔය, නැගෙනහිරට : මානැවිල්ලේ ඔය, දකුණට : මානැවිල්ලේ ඔය සහ වැලිමඩ සිට බණ්ඩාරවෙලට යන පාර හා ගම්මුන්ගේ ඉඩම්, බටහිරට : හීල්පන්කඳුර වශයෙන් මායිම් වූ මාස්නාවත්ත නමැති අක්කර 10, රූඩ් 3, පර්චස් 29 ක ප්‍රමාණය ඇති ඉඩම. මෙය බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ අංක සී. 330/266 වශයෙන් ලියාපදිංචි කර ඇත.

(ආ) ඉහත සඳහන් මිරහවත්තේ ගම පිහිටි උතුරට : ගල්පොතු ඇල්ලේ කුඹුර, නැගෙනහිරට : ඔය, දකුණට හා බටහිරට : අගල සහ පාරද වශයෙන් මායිම් වූ අක්කර 16 ක් ප්‍රමාණය ඇති මාස්නාවත්ත, මන්කඩවත්ත හා හීල්පන්කඳුර ඇල් හේන නමැති ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කරන කාර්යාලයේ අංක සී. 216/15 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත අංක 1, 2, 3 හා 4 යනුවෙන් විස්තර කර ඇත්තේ පිඹුර අංක 1677 තේ පෙන්වා ඇති දැනට ජවර්හලන්ඩ් වත්තේ ඉඩම් කොටස් ය.

අ. තේ. සිවලිංගම්,
ඌව පළාතේ පිස්කල් වෙනුවට.

1970 නොවැම්බර් මස 3 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේදීය.

11-583

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ළුවමනා ගැසට් පත්‍රයට දන්වීම් ඇතුලත් වනවාස් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. ජී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.